(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 3.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 සැප්තැම්බර් මස 22 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් (සංශෝධන),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන),— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

මුදල් අමාත්‍යතුමා,— ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන),— 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

4.

මුදල් අමාත්‍යතුමා,— මුදල්,— මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද, කැසිනෝ කර්මාන්ත අය බද්ද, සුපිරි වාසි බද්ද, ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද, නිවාස සඳහා සෘජු චන්ද්‍රිකා සේවා අය බද්ද, චන්ද්‍රිකා ස්ථාන අය බද්ද, ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද, මන්දිර බද්ද, විගමන බද්ද සහ මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව පැනවීම සඳහා විධිවිධාන සැලස්වීම පිණිස ද, ඊට සම්බන්ධ හා ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

5.

මුදල් අමාත්‍යතුමා,— ආර්ථික සේවා ගාස්තු (සංශෝධන),— 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

6.

මුදල් අමාත්‍යතුමා,— විදුලි සංදේශ බදු (සංශෝධන),— 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

7.

මුදල් අමාත්‍යතුමා,— ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන),— 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2015 සැප්තැම්බර් මස 23 වැනි බදාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 1),— ස්ථාවර නියෝග අංක 121හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පවත්නා සැසි වාරයේ සේවය සඳහා වූ තේරීම් කාරක සභාව කථානායකතුමාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් වන පාර්ලිමේන්තුව විසින් නම් කරන ලද මන්ත්‍රීන් දහනව දෙනෙකුගෙන් (19) සමන්විත විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 2),— අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාර, මෙම කාරක සභාවේ සභාපති වන ගරු කථානායකතුමාට අතිරේකව, පහත නම් සඳහන් මන්ත්‍රීන් දහනව දෙනා (19) පවත්නා සැසිවාරය තුළදී තේරීම් කාරක සභාවේ සේවය කළ යුතු ය:—

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු මනෝ ගනේසන් මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදය සහ (4) සහ (5) අනු ව්‍යවස්ථා යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා යන දෙදෙනාගේම නාම යෝජනා කිරීම මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන්නාවූ පහත සඳහන් තැනැත්තන් නම් කරනු ලැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාවේ (5) අනු ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1. ආචාර්ය අහංගමගේ ටියුඩර් ආරියරත්න මහතා
2. ශිබ්ලි අසීස් මහතා
3. ආචාර්ය රාධිකා කුමාරස්වාමි මෙනෙවිය

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**